පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය : ප්‍රායෝගික හා තාක්ෂණ කුසලතා

සතිය : 10

6 ශ්‍රේණිය

සකස් කිරීම :

Department of Education Sabaragamuwa Province/ Weekly School

# සරු බිමෙන් නෙළමු අපි අස්වනු.

මිනිසාට අවශ්‍ය නිෂ්පාදන හා සේවා රැසක් විවිධ ශාක මගින් ලබා දෙයි. ආහාර ,දැව, ඖෂධ, ආදී නිෂ්පාදන සපයන ශාක වාතාශ්‍රය පිරිසිදු කිරීම, වර්ෂාව ලබා දීම, සෙවණ සැපයීම හා සෝදාපාළුව වැලැක්වීම වැනි ඉතා වටිනා සේවා රැසක් සපයයයි. දිනෙන් දින වැඩිවන ජනගහනයත් සමග අප අවට ඇති ශාක සහිත පරිසරය ඉතා සීග්‍රයෙන් විනාශ වී යනු දැකිය හැක. එබැවින් අප සියලු දෙනා හැකි සෑම විටම ශාක වගා කළ යුතුව ඇත.

1. ඔබේ ගෙවත්තේ පහසුවෙන් වගා කළ හැකි ශාක වර්ග දහයක් නම් කරන්න.

2. ගෙවත්තේ ශාක වගා කිරීමෙන් ලබා ගත හැකි ප්‍රයෝජන පහක් ලියන්න.

3. පහත සඳහන් එක් එක් ශාක කාණ්ඩය සඳහා ගෙවත්තේ වගා කිරීමට සුදුසුයැයි ඔබ යෝජනා කරන බෝග වර්ග තුන බැගින් ලියන්න.

   ආහාර
   ඖෂධ
   රසකාරක
   අලංකාරය.

4. සාර්ථක හා යහපත් ගෙවතු වගාවකදී අප විසින් අනුගමනය කළ යුතු දෑ ලැයිස්තුගත කරන්න.